State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper

අ.පොෂ. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

History

ඉතිහාසය

(QUESTION PAPER) - I

ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

NenasaTV

The National e-learning Portal for The General Education

අ.පොෂ.(සා / පෙළ) විභාගය –2020

ආදර්ශ ප්‍රශ්න පත්‍රය I

ඉතිහාසය **කාලය පැය 1යි**

<u>සැලකිය යුතුයි.</u>

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (i), (ii),(iii),(iv) පිළිතුරු නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න**
- **ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

01. මහාවංශයෙහි අර්ථ විවරණය සඳහා රචනා කොට ඇති ටීකාව හඳුන්වන්නේ කුමන නමකින්ද?
    I. සමන්තපාසාදිකාව.
    II. සීහලට්ඨකථා මහාවංශය.
    III. වංසත්ථප්පකාසිනිය.
    IV. බෝධි වංශය.

02. ඉතිහාසය හැදෑරීමේ දී පුරා විද්‍යා මූලාශ්‍රයන් වැදගත් වන්නේ මින් කුමන හේතුව නිසා ද?
    I. ඓතිහාසික සිදුවීම් වලට වඩා පසුකාලීන වීම ය .
    II. විචාර බුද්ධියෙන් යුතුව පරිශීලනය කළ හැකි වීම ය.
    III. ඓතිහාසික සිදුවීම් වලට සමකාලීන වීම ය.
    IV. පැරණි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව වීම ය.

03. මෙරට ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු ගත හැකි 'බටදොඹලෙන' කුමන පරිසර කලාපයකට අයත්ද?
    I. කදුකර වියළි අතර මැදි කලාපයට ය.
    II. පහතරට වියළි කලාපයට ය.
    III. තෙත් කලාපයට ය.
    IV. පහතරට අතර මැදි වියළි කලාපයට ය.

04. ඓතිහාසික බුන්දල වැල්ලෙගංගොඩ ප්‍රදේශයේ කැනීම් වලින් සොයා ගත් ගල්මෙවලම් සහිත බොරලූ තට්ටුව අයත් කාල වකවානුව කුමක්ද?
    I. වසර 125000. II. වසර 38000. III. වසර 80000. IV. වසර 28000.

05. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ ලක්ෂණයක් නොවන පිළිතුර වන්නේ,

I. පිළිස්සූ මැටිවළන් භාවිතය.
II. අක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි අනුගමනය කිරීම.
III. ලෝහ භාවිතය ආරම්භ කිරීම.
IV. ගම්වල ජීවත්වීම ආරම්භ කිරීම.

06. හෙලෝසීන යුගය නම් භූ අවධිය අයත් කාල පරිච්ඡේදය කුමක්ද?

1. ක්‍රි:පූ: 7000-4500. 2. ක්‍රි:පූ: 2000-4500. 3. ක්‍රි:පූ: 7000-5000. 4. ක්‍රි:පූ: 10000-7500.

07. මුල් ඓතිහාසික යුගයේ වඩුවන් විසූ ගම් හඳුන්වන ලද්දේ,

I. කසීකාරගාම. II. මණිකාරගාම. III. කුම්භකාරගාම. IV. වඩ්ඩකීගාම.

08. දඹුල්ල කළුදියපොකුණ සෙල්ලිපියෙහි සඳහන් වන්නේ,

I. දසගම් ඇත්තන් පත්කිරීම පිළිබඳව ය.
II. ග්‍රාමසීමාවන් පිළිබඳව ය.
III. බෞද්ධ විහාරයක දානමය ගැටලුවක් පිළිබඳව ය.
IV. ගම් පාලනය පිළිබඳව ය.

09. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස පසුකාලීනව ගංගා නිම්න තුලට අවතීර්ණය වූ ආකාරය පිළිබඳව පෙන්වා දෙන්නේ,

‘අ’	‘ආ’
1. ප්‍රථමවරට අනුරාධපුරය පාලන මධ්‍යස්ථානය කිරීම.	A-භාතිකාභය රජතුමා.
2. ශ්‍රී මහා බෝධි ශාඛා විවිධ ප්‍රදේශවල රෝපණය කිරීම.	B-දුටුගැමුණු රජතුමා.
3. ප්‍රථමවරට දේශපාලන බලය මධ්‍ය ගත කිරීම.	C-පණ්ඩුකාභය රජතුමා.
4. රෝමය සමග රාජ්‍යතාන්ත්‍රික සබඳතා පැවැත්වීම.	D-දේවානම්පියතිස්ස රජතුමා.

I. කලාඔය ගංගා නිම්නයේ පැරණි ජනාවාස අධ්‍යයනයෙනි.
II. වලවේ ගංගා නිම්නයේ පැරණි ජනාවාස අධ්‍යයනයෙනි.
III. කිරිදිඔය ගංගා නිම්නයේ පැරණි ජනාවාස අධ්‍යයනයෙනි.
IV. මල්වතුඔය ගංගා නිම්නයේ පැරණි ජනාවාස අධ්‍යයනයෙනි.

10. ‘වැව් ප්‍රපතනය’ සම්බන්ධයෙන් පහත සඳහන් වන සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

I. වැවක අතිරික්ත ජලය පහත් භූමියක පිහිටිවැවකට රැගෙන යාම.
II. ඇළමාර්ග දෙපස භූමියේ තෙතමනය ආරක්ෂා කිරීම.
III. වැඩිවන ජනගහනයට සාපේක්ෂව බෝග වගාව පහසුවෙන් කළ හැකිවීම.
IV. මහවැව් සෑදීමට පදනමක් දැමීම.

11. ‘ආ’ නීරුවේ රජවරු ‘අ’ නීරුවේ සඳහන් කාර්යයන් හා නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

I. CBDA II. CDBA III. DACB IV. CADB

12. පහත සඳහන් ඓතිහාසික අවස්ථා අතුරින් වසභ රජතුමා හා සම්බන්ධ සිදුවීම් පමණක් දක්වා ඇති පිළිතුර තෝරන්න.

A. ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය බවට පත්කිරීම.
B. මධ්‍යගත පාලනය ශක්තිමත් කිරීමට පාලන ඒකක පවත්වා ගැනීම.
C. රාජ්‍ය බදු අය කිරීම වඩාත් විධිමත්ව පවත්වා ගැනීම.
D. රුවන් වැලි සෑ දොරටු අසල දන්සැල් පැවැත්වීම.
E. ප්‍රථමවරට විශාල ප්‍රමාණයේ වැව් ඉදිකිරීම.
F. භික්ෂූන් වහන්සේගේ සිව්පසය උදෙසා දීමනා ලබාදීම.

I. ADEF II. ABDF III. BCFE IV. BCEF

13. වෙළෙදාමේ සාර්ථකත්වය උදෙසා චීනය සමග රාජ්‍යතාන්ත්‍රික සබඳතා ගොඩනගාගත් රජතුමා වන්නේ,

‘අ’	‘ආ’
i. මුතුගල සෙල්ලිපියේ zමජ්ජිමZ	A-කම්මල්කරුවෙකි .
ii. මණ්ඩාගල සෙල්ලිපියේ zතුලදරZ	B- ඇන්දන් ශිල්පියෙකි.
iii. වේගිරිය සෙල්ලිපියේ zසුමනZ	C-රන්කරුවෙකි.
iv. වෙහෙරකෙම සෙල්ලිපියේ zතතවයZ	D-නූල්කටින්නෙකි.

I. පළමුවන ගජබාහු රජතුමා ය. II. හයවන අග්ගබෝධි රජතුමා ය.
III. පළමුවන විජයබාහු රජතුමා ය. IV. භාතිකාභය රජතුමා ය.

14. හේන් වගාව වෙනුවෙන් අයකළ කැතිඅඩ සහ කෙටුකනක බදු අහෝසි කළ රජතුමා වන්නේ,

I. නිශ්ශංකමල්ල රජතුමා ය. III. මහසෙන් රජතුමා ය.
III. හතරවන කාශ්‍යප රජතුමා ය. IV. පස්වන උයද රජතුමා ය.

15. ‘අ’ තීරුවේ සෙල්ලිපි හා ‘ආ’ තීරුවේ සඳහන් ශිල්පීන් නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර කුමක්ද?

I. BADC II. ADBC III. BCAD IV. ACBD

16. ශ්‍රී ලංකාවේ පාලකයන් අන්තර් ජාතික වෙළෙඳ කටයුතු හොදින් පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර ගත් බව සඳහන් කළ තැනැත්තා වන්නේ,

I. අරාබි ජාතික අල් බලසූරිය. II. ඉබ්න් ශහ්රියර්. III. ඉබන් බතූතාය. IV. හියුං සියෑං.

17. රජරට ශිෂ්ටාචාරයට අයත් බොහෝ කාව්‍යයන් හී තේමාව ලෝකයේ පවතින අනිත්‍ය ස්වාභාවයයි. එයට හේතුව ලෙස සැලකිය හැක්කේ,

I. පන්සල් ආශ්‍රිතව අධ්‍යාපනය ව්‍යාප්තවීම ය.

II. බුදු දහමින් ලද හික්මීමත් ස්වාභාව ධර්මය සමග කටයුතු කිරීමත් ය.

III. ජාතක කතා පොතෙහි ආභාසය ලැබීම ය.

IV. භික්ෂූන් වහන්සේ පමණක් කාව්‍යකරණයේ නිරතවීම ය.

18. සීගිරි ජල උද්‍යානයේ ජලමල් හතරක් නිර්මාණය කිරීමට හේතුව වන්නේ,

I. ජලය ඉහළට එසවීමට පීඩනයක් අවශ්‍ය නිසා ය.

II. සිදුරුවල විෂ්කම්භය වෙනස් කිරීමට ය.

III. රොන්මඩ ගරුත්ව බලයෙන් පහළට කිදා බැසීමට ය.

IV. ඉහළට නගින ජලකෙඳේ උසෙහි යම් වෙනසක් ඇතිකිරීමට ය.

19. දෙහිගහ ඇලකන්ද ප්‍රදේශයේ යකඩ නිස්සාරණ උදුන දැල්වීම සිදුකර තිබෙන්නේ,

I. මයිනහම ආධාරයෙනි. II. ස්වාභාවික සුළං භාවිතයෙනි.

III. මරංගස් පිළිස්සීමෙන් ය. IV.යකඩමරං අඟුරු යෙදීමෙන් ය.

20. 'අ' තීරුවේ සඳහන් නියෝග හා 'ආ' තීරුවේ එම නියෝගය දුන් රජවරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

'අ'	'ආ'
මිණී මැරීමට ද`ඩුවම එල්ලා මැරීම.	A- හතරවන උදය රජතුමා.
වෙළෙදාම් කරන අයගෙන් පමණක් බදු ගැනීම.	B- නිශ්ශංකමල්ල රජතුමා.
කිසිදු සතෙකු නොමැරිය යුතුය.	C- හතරවන මිහිඳු රජතුමා.
වාරි ජල භාන කඹුරුවල මුං ඇට වැපිරීම නොකළ යුතුය.	D- ආමණ්ඩ ගාමිණී අභය රජතුමා.

I. BADC II. CACB III. CDBA IV. CADC

21. අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා සහ පොළොන්නරුව අගනුවර බවට පත්කර ගත් රජවරු නිවැරදිව සඳහන් පිළිතුර තෝරන්න.

I. පස්වන මිහිඳු රජතුමා, පළවන පරාක්‍රමබාහු රජතුමා.

II. පස්වන මිහිඳු රජතුමා , පළවන විජයබාහු රජතුමා.

III. හතරවන කාශ්‍යප රජතුමා , හතරවන මිහිඳු රජතුමා.

IV. පළවන විජයබාහු රජතුමා , හතරවන කාශ්‍යප රජතුමා.

22. කුරුණෑගල රාජ්‍ය සමයෙහි දෙවන භුවනෙකබාහු රජතුමාට පසුව රාජ්‍යත්වයට පත් වන්නේ,

I. හතරවන පරාක්‍රමබාහු රජතුමා ය. II. තුන්වන භුවනෙකබාහු රජතුමා ය.

III. පළවන පරාක්‍රමබාහු රජතුමා ය. IV. තෙවන වික්‍රමබාහු රජතුමා ය.

23. ගාල්ලේ ත්‍රීභාෂා ලිපිය පිහිටුවන ලද්දේ,

I. 1411 II. 1405 III. 1505 IV. 1409

24. පහත සඳහන් කරුණු අතරින් කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජතුමා විසින් ඉටුකළ සේවාවන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A. වන්නිප්‍රදේශය යටත් කර ගැනීම.

B. ජෝතිය සිටාණන්ගේ කැරල්ල පරාජය කිරීම.

C. අම්බුළුගල කුමාරයා ලවා යාපනය යටත් කර ගැනීම.

D. රට එක්සේසත් කිරීම.

E. අධ්‍යාපනයට සාහිත්‍යයට රාජ්‍ය අනුග්‍රහය දීම.

I. BCDE II. ABCE III. ABDE IV. ACDE

25.පහත සඳහන් කරුණු අනුව ප්‍රකාශිත රජතුමා කවුද?

අ. විමලධර්මසූරිය රජුගේ ඥාති සොහොයුරෙකු වීම.

ආ. උඩරට රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීමේ අභියෝගය ජයගැනීම.

ඇ. පෘතුගීසි තර්ජන අවම කර ගැනීමට සමත්වීම.

ඈ. දෝන කතිරිනා විවහා කර ගැනීම.

ඉ. උඩරට රාජ්‍ය කොටස් තුනකට බෙදා කුමාරවරුන්ට පවරාදීම.

I. දෙවන රාජසිංහ රජතුමා. II. සෙනරත් රජතුමා.

III. දෙවන විමලධර්මසූරිය රජතුමා. IV. පළවන විමලධර්මසූරිය රජතුමා.

26. යුරෝපා පුනරුද සමයේ කලා ශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

අ. කලා ශිල්පීන් ශ්‍රේණි වශයෙන් සවිංධානය සිටීම.

ආ. ලෞකික රස විඳීනය අගයන ධනවතුන්ගේ අනුග්‍රහය.

ඇ. කලා ශිල්පීන්ගේ නමින් නිර්මාණ එළිදැක්වීම.

ඈ. කලා නිර්මාණ ආගමික නැඹුරුවක් ගැනීම.

ඉ. ස්වාධීන දක්ෂතා මතු කරමින් නිර්මාණ බිහිවීම.

I. ඇ ,ඈ .ඉ. II. අ ,ඈ ඉ. III. ආ ,ඉ .ඇ. IV. ඉ ,ආ , ඇ.

27. ලන්දේසීන් ලිපි ගනුදෙනු වලදී "ඔබ වහන්සේගේ සුවච කීකරු සේවක" වැනි පද භාවිත කළේ කුමන රජතුමා වෙනුවෙන්ද?

I. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා. II. දෙවන රාජසිංහ රජතුමා.

III. රාජාධිරාජසිංහ රජතුමා. IV. ශ්‍රී විජය රාජසිංහ රජතුමා.

28. 'අ' තීරුවේ සඳහන් ඉංග්‍රීසි නියෝජිතයින් හා 'ආ' තීරුවේ එම නියෝජිතයින් ධූත සඛදතා පැවැත් වූ රජවරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

'අ'	'ආ'
1. ජෝන් ෆයිබස්.	අ. රාජාධිරාජසිංහ රජතුමා.
2. හියුබොයිඩ්.	ආ. දෙවන විමලධර්මසූරිය රජතුමා.
3. රොබට් ඇන්ඩaසන්.	ඇ. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා.
4. මැක්ඩෝවල් සෙනෙවියා.	ඈ. දෙවන රාජසිංහ රජතුමා.
	ඉ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා.

I. ඇ, අ, අ, ඉ. II. අ, ආ, ඉ, ඇ. III. ඇ, ඉ, අ, අ. IV. ඉ, ඇ, ආ, අ.

29. කාර්මික විප්ලවයට සමගාමීව ප්‍රවර්ධනය වූ කෘෂි කාර්මික විප්ලවයේ ලක්ෂණයන් නොවන පිළිතුර තෝරන්න.

අ. කෘෂි කර්මය වෙළෙදාම අරමුණු කර ගැනීම.

ආ. මහා පරිමාන ගොවිබිම් ඇතිවීම.

ඇ. පෞද්ගලික කුඩා ගොවි ඉඩම් පරිහරණයට සීමාවීම.

ඈ. ශෂ්‍යමාරු ක්‍රමය හා කට්ටි මාරු ක්‍රමය ඇරඹීම.

ඉ. ගුවානෝ පොහොර විශේෂය සොයා ගැනීම.

ඊ. මිනිස් ශ්‍රමයට ප්‍රමුඛත්වය දීම.

I. අ, ඊ. II. ආ, ඉ. III. ආ, ඈ IV. ඇ, ඊ.

30. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයෙහි 1818 සටනින් අනතුරුව 'ඉංග්‍රීසි ප්‍රකාශනය' නිකුත් කළ ආණ්ඩුකාරවරයා කවුද?

I. තෝමස් මේඩ්ලන්ඩ් ආණ්ඩුකාරවරයා. II. රොබඩ් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා.

III. සර් පෙඩිරික් නෝර්ත් ආණ්ඩුකාරවරයා. IV. ටොරින්ටන්සාමි ආණ්ඩුකාරවරයා.

31. දමිළ සිසුන්ට හින්දු සංස්කෘතියට ගැලපෙන අධ්‍යාපනයක් ලබාදීම සඳහා 'වන්නපොනෙයි ශෛව ප්‍රකාශ විද්‍යාලය' පිහිටුවීමට පුරෝගාමී වූයේ,

I. ආරුමුග නාවලර්තුමා ය. II. පොන්නම්බලම් රාමනාදන්තුමා ය.

III. පොන්නම්බලම් අරුණාචලම්තුමා ය. IV. පී. සුන්දරම්තුමා ය.

32. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් පත්කරන ලද්දේ කුමන පාර්ශවයක් විසින්ද?

I. අග්‍රවිනිශ්චයකාරවරයා විසින් ය. II. අග්‍රාණ්ඩුකාරවරයා විසින් ය.

III. අධිකරණසේවා කොමිෂන විසින් ය. IV. අග්‍රාමාත්‍යවරයා විසින් ය.

33. 1972 ආණ්ඩුක්‍රමය යටතේ අධිකරණ පද්ධතියෙහි 'අපරාධ නඩු' විනිශ්චය කිරීමට පවරා තිබුණේ කවර අධිකරණ ආයතනයකටද?

I. මහෙස්ත්‍රාත් අධිකරණවලට ය. II. දිසා අධිකරණවලට ය.

III. පළාත් අධිකරණවලට ය. IV. ප්‍රාථමික අධිකරණවලට ය.

34. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව "මූලික අයිතිවාසිකම්" විග්‍රහ කරන්නේ කුමන වගන්තිය යටතේද?

I. තෙවන පරිච්ඡේදය යටතේ ය. II. අටවන වගන්තිය යටතේය.

III. හත්වන පරිච්ඡේදය යටතේ ය. IV. 129 වැනි වගන්තිය යටතේය.

35. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව අනුව ප්‍රථමවරට ජනමත විචාරණයක් පවත්වන්නේ කිනම් වර්ෂයේදී ද?

I. 1989 II. 1982 III. 1994 IV. 2005

36. මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ කොන්මලේ, වික්ටෝරියා සහ රන්දෙනිගල ව්‍යාපාර සඳහා මූල්‍යාධාර සැපයූ රටවල් පිළිවෙලින් සඳහන් පිළිතුර තෝරන්න.

I. බටහිර ජර්මනිය, ස්විඩන්, බ්‍රිතාන්‍ය. II. බ්‍රිතාන්‍ය, ස්විඩන්, බටහිර ජර්මනිය.

III. ස්විඩන්, බ්‍රිතාන්‍ය, නෝර්වේ. IV. ස්විඩන්, බ්‍රිතාන්‍ය, බටහිර ජර්මනිය.

37. නිදහසෙන් පසුව රජය සතු ඉඩම් කලමනාකරණයට පිහිට වූ ආයතන'අ' නීරුවේ ද, එම ආයතන පිහිට වූ වර්ෂ 'ආ' නීරුවේ ද ස`දහන්ය.'අ' සහ 'ආ' නිවැරදිව ගැලපූ විට ලැබෙන

'අ'	'ආ'
රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීම.	අ. 1958
උඩරට වතු සංවර්ධන මණ්ඩලය පිහිටුවීම.	ආ. 1976
ජනතා වතු සංවර්ධන මණ්ඩලය පිහිටුවීම.	ඇ. 1978
	ඈ. 1983

පිළිතුර තෝරන්න.

I. අ, ආ, ආ. II. අ, ඇ ආ. III. ආ, ඇ, අ. IV. ඇ, අ, ආ.

38. පළමුවන ලෝක යුද්ධයට සම්බන්ධ වූ මිත්‍ර පිලේ රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

I. ජර්මනිය, ඔස්ට්‍රියාව, තුර්කිය, හංගේරියාව.

II. තුර්කිය, ප්‍රංශය, ඉතාලිය, රුසියාව.

III. ප්‍රංශය, මහා බ්‍රිතාන්‍ය, රුසියාව, ඇමරිකාව.

IV. රුසියාව, ප්‍රංශය, ඔස්ට්‍රියාව, මහා බ්‍රිතාන්‍ය.

39. දෙවන ලෝක යුද්ධයේ දී ජපානය කොළඹට බෝම්බ හෙළන ලද්දේ ,

I. 1942 අප්‍රේල් 05 දිනය.
II. 1942 අගෝස්තු 09 දිනය.
III. 1942 අප්‍රේල් 07 දිනය.
IV. 1942 අගෝස්තු 10 දිනය.

40. එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාෂය තෝරන්න.

I. එක්සත් ජාතීන්ගේ ප්‍රධාන අධිකරණය ජාත්‍යන්තර අධිකරණය වේ.

II. එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පරිපාලන කාර්යාලය මහලේකම් කාර්යාලය යි.

III. ආර්ථික හා සමාජ මණ්ඩල සාමාජික සංඛ්‍යාව 56කි.

IV. වර්තමානයේ භාරකාර මණ්ඩලය අක්‍රීයව පවතී.

State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper

අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

History

ඉතිහාසය

(QUESTION PAPER) - II

ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

NenasaTV

The National e-learning Portal for The General Education

අ.පොෂ.(සා / පෙළ) විභාගය –2020

ආදර්ශ ප්‍රශ්න පත්‍රය

II පත්‍රය

ඉතිහාසය **කාලය පැය තුනයි**

* **I කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්යයය වේ.**
* **II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.**
* **පිළිතුරු සිපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.**

I කොටස

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් තෙකාටසෙහි ද ලකුණු කර නම් කරන්න

(i) මැණික් ගඟ, වනවාහිනී නදී, යෝධ වැව, ලංකා පටුන, නල්ලූරු කෝවිල, පේදුරු තුඩුව, සෙංකඩගල, කාචර ගාම, පුලතිසිපුර, කල් පිටිය අර්ධද්වීපය, ගෝකණ්ණ, කොළඹ

(ලකුණු 12 යි)

(ii) මලයාව, කළු මුහුදු, ඉස්තාම්බුල්, ජාවා, ඉතාලි අර්ධද්වීපය, ගෝව

(ලකුණු 06 යි)

(අ) (i) පහත A, B,C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාල පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. ක්‍රි.ව. 1505 දී ලංකාවට පැමිණි පළමු පෘතුගීසි ජාතිකයා

B. ක්‍රි.ව. 1255 දී කාලිංග මාඝ පරාජය කළ මෙරට රජතුමා

C. එකසත් ජාතීන්ගේ සංවිධානයේ මූලස්ථානය පිහිටි රට

D. දෙවන ලෝක යුධ සමයේ ජර්මනියේ සිටි පලකයා

(ලකුණු 04යි)

* **A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.**

(ii) 1. මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා කවුද?

2. එම පුද්ගලයා අයතුවන රාජධානිය කුමක් ද?

3. මෙම පිළිරුව දක්නට ලැබෙන ස්ථානය කුමක් ද?

4. එම ස්ථානයේ දක්නට ලැබෙන තවත් පාලකයෙකු සඳහන් කරන්න.



A රූපය

(iii) 1. මෙම රූපයේ දැක්වෙන්නේ කුමක් ද?

2. එය තැනීමට යොදා ගෙන ඇත්තේ නෙවා ද?

3. මෙය දක්නට ලැබෙන්නේ කුමන ගංඟාව ආශ්‍රිතව ද?

4. මෙය කුමන රාජධානි සමයට අයත් ද?



B රූපය

II කොටස

02

(i) ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ දක්නට ලැබුණු ගම්වල ජීවත් වූ පුද්ගලයන් කුමන වෘත්තියකට අයත් දැයි ඉදිරියෙන් ලියා දක්වන්න.

a. කේවට්ටගාම

b. කසිකාරගාම

c. වඩ්ඪකීගාම

(ලකුණු 03 යි)

(ii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක හතරක් නම් කරන්න

(ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ ලක්ෂණ දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න

(ලකුණු 05 යි)

(iv) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයෙ ජීවත් වූ මිනිසා දියුණු තාක්ෂණයක් වෙත යොමු වී සිටි ආකාරය කරුණු 03 ක් යටතේ විස්තර කරන්න.

(ලකුණු 06යි)

03

(i) පහත කරුණුවලට අදාල බදුවර්ග වරහන් තුළින් තෝරා ලියන්න.

a. රජුගේ ඉඩම් පරිහරණය වෙනුවෙන්

b. ඇළ මාර්ගවල මසුන් අල්ලන අය වෙනුවෙන්

c. රජුගේ වැව්වල ජලය සපයාගත් අය වෙනුවෙන්

(දකපති, බොජකපති, මතරමජික)

(ලකුණු 03 යි)

(i) පහත සඳහන් කරුණුවලට අදාල පුද්ගලයන් වරහන් තුළින් තෝරා ලියන්න.

(ii)

a. ශ්‍රී ලංකාව රතු කැට දිවයින ලෙස හැඳින් වූ පාලකයා

b. පත්තිනි දේවාලයෙක් විවෘත කිරීමට ඉන්දියාවේ චේර රාජ්‍යයට ගිය පාලකයා

c. බදුලු ටැම් ලිපිය කරවූ පාලකයා

d. කෝරල වරුන්ගෙන් ගොඩනැගූ අගම්පොඩි සේනාව යොදාගත් පාලකයා

(I ගජබාහු රජු / අල් - බලසූරි රජු / ඉලනාග රජු / iv උදය රජු)

(ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ අතීත ආර්ථිකයේ පැවති ප්‍රධාන ලක්ෂණ දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)

(iv) ශ්‍රී ලංකාවේ රාජ්‍යයන්ව සංකල්පය බලවත් වීමේ දී රජගේ වගකීම හා කාර්යයභාරයන් තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න

(ලකුණු 06 යි)

04

(i) පහත වැව් ගොඩනැගී ඇති ගංඟාව වරහන් තුළින් තෝරා ලියන්න

a. ඉරණමඩු වැව

b. තඹබෝව වැව

c. හුරුළු වැව

(මල්වතු ඔය / මී ඔය / කනගරායන් ආරු / කලා ඔය / යාන් ඔය)

(ලකුණු 03 යි)

(ii) පහත වැව් හා ඇල මාර්ග ඉදි කළ රජවරු නම් කරන්න

a. මහකනදරා වැව

b. මහවිලච්චිය වැව

c. යෝධ ඇළ

d. ඇළහර ඇළ

(ලකුණු 04 යි)

(iii) ලංකාවේ ප්‍රථම වැව ඉදිකරමින් අනුරාධපුරය ගොඩ නැඟූ පණ්ඩුකාභය රජුගේ කාර්යභාරය කරණු 02 ක් යටතේ විස්තර කරන්න.

(iv) අතීත රජවරු වැවක් නිර්මාණය කිරීමේ දී යොදාගත් තාක්ෂණික ලක්ෂණ කරුණු 03 ක් යටතේ විස්තර කරන්න.

05

(i) පෘතුගීසීන් ලංකාවට පැමිණීම හා සම්බන්ධ පහත කරුණුවලට අදාල පුද්ගලයන් නිවැරදිව වරහන් තුළින් තෝරාන්න.

a. ක්‍රි. ව. 1505 දී පෘතුගීසීන් පැමිණෙන විට උඩරට සිටි පාලකයා

b. මුල්ලේරියා සමගින් පෘතුගීසීන් පරාජය කල පාලකයා

c. පෘතුගීසීන්ට එරෙහිව කැලිකිටහි සැමොරින්ගේ ආධාර ලබා ගත් සීතාවක පාලකයා

(ලකුණු 03 යි)

(VIII වන වීර පරාක්‍රමබාහු රජු / සේනාසම්මත වික්‍රමබාහු රජු / මායාදුන්නේ රජු / ටිකිරි කුමරු)

(ii) ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලන සමය ඇසුරින් පහ කරුණුවලට අදාල පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න

a. මෙරට රජවරු සමඟ මුලින්ම ගිවිසුමකට එළඹි ලන්දේසි නායකයා

b. ක්‍රි. ව. 1766 ගිවිසුමට අන්සන් තැබූ මෙරට පාකයා

c. ලන්දේසි සමයේ ත්‍රී සිංහලාධීශ්වර විරුධය භාවිත කල පාලකයා

d. ක්‍රි. ව. 1602 දී ලංකාවට පැමිණි පලමු ලන්දේසි ජාතිකයා

(II රාජසිංහ / ජොරිස් වැන් ස්පිල්බර්ජන් / වෙස්ටර් වෝලඩ් / කීර්ති ශ්‍රී රාජසිංහ / ජෝන් ෆයිබස්)

(ලකුණු 04 යි)

(iii) ලන්දේසි සමයේ මෙරට ආර්ථිකයේ ඇති වූ දියුණුව කරුණු 02 ක් යටතේ විස්තර කරන්න.

(ලකුණු 05 යි)

(iv) පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට උඩරට රාජධානිය යටත්කර ගැනීමට නොහැකි වූ හේතු තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 06 යි)

06

(i) කන්ද උඩරට රාජධානිය හැඳින් වූ වෙනත් නම් 03 ක් ලියන්න.

(ලකුණු 03 යි)

(ii) කන්ද උඩරට රාජධානිය පාලනය කළ සිංහල රජවරු දෙදෙනෙක් හා නායක්කාර් වංශික රජවරු දෙදෙනෙක් පිළිවෙළින් ලියන්න.

(ලකුණු 04 යි)

(iii) උඩරට රාජධානියේ දක්නට ලැබුණු සමාජයමය ලක්ෂණ 02 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

(iv) උඩරට රාජධානියේ ශ්‍රේෂ්ඨතම පාලකයෙකු ලෙස I වන විමලධර්ම සූරිය රජුගේ සේවාවන් 03 ක් නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 06 යි)

07

(i) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමය ඇසුරින් පිළිතුරු සපයන්න.

a. බ්‍රිතාන්‍යයන් මුහුදුබඩ තීරයේ බලය හිමිකර සමයේ උඩරට සිටි පාලකයා

b. 1815 උඩරට ගිවිසුම අත්සන් කළ සමයේ බ්‍රිතාන්‍යයේ සිටි පාලකයා

c. මෙරට පැවති රාජකාරි ක්‍රමය මුලින්ම අවලංගු කල ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා

(ලකුණු 03 යි)

(ii) පහත කරුණුවලට අදාල පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

a. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අත් අඩංගුවට පත් වූ ප්‍රදේශය

b. බ්‍රිතාන්‍යයන්ගේ ප්‍රථම ප්‍රහාරය එල්ල වූ මෙරට වරාය

c. 1818 අරගලයට ආසන්නම හේතුව හා සම්බන්ධ ප්‍රදේශය

d. 1848 අරගලය ආරම්භ වූ ප්‍රදේශය

(ත්‍රිකුණාමලය / මැද මහනුවර / මාතලේ / ඌව වෙල්ලස්ස)

(ලකුණු 04 යි)

(iii) කෝල්බෘක් ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමත් සමඟ මෙරට වතුවගාව දියුණු වූ අතර වතුවගාව නිසා මෙරට ආර්ථිකයේ ඇති වූ යහපත් ප්‍රතිඵල 02 ක් නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 05 යි)

(iv) 1818 අරගලයෙන් වසර 30කට පසු මෙරට ගොවිජනතාව නිදහස් අරගලයක් වෙත යොමු වීමට බලපෑ හේතු 03 ක් විස්තර කරන්න.

(ලකුණු 06 යි)

II කොටස

08

(i) යුරෝපයේ පුනරුද සමයේ සිදු වූ දේශ ගවේෂණ ව්‍යාපාරය තුළ දී පහත සඳහන් දේශ ගවේෂකයන් සොයා ගිය රටවල් වරහන් තුළින් තෝරා ලියන්න.

a. ෆර්ඩිනන්ඩ් මැගලන්

b. වස්කෝ ද ගාමා

c. ක්‍රිස්ටෝපර් කොලම්බස්

(ශ්‍රී ලංකාව / ඉන්දියාව / හස් පැණියෝලාව / පිලිපීනය)

(ලකුණු 03 යි)

(ii) යුරෝපයේ පුනරුදය ඇසුරෙන් පහත සිදුවීම්වලට අදාල පුද්ගලයින් වරහන් තුළින් තෝරා ලියන්න.

a. සිස්ටයින් දේවස්ථානයේ සිවිලිමේ චිත්‍ර ඇඳීම

b. ලෙඩ රෝග සෑදීමට තුඩුදෙන හේතු සෙවීම

c. මුද්‍රණ යන්ත්‍රය නිපදවීම

d. ආගමික ප්‍රතිසංස්කරණයට නායකත්වය දීම

(පැරසල්සස් / මයිකල් ඇන්ජිලෝ / ලියනාඩ්‍රෝ ඩාවින්චි / මාටින් ලූතර් / ජොහැන්නස් ගුටෙන්බර්ග් / විලියම් හාවේ)

(ලකුණු 04 යි)

(iii) යුරෝපයේ දේශ ගවේෂණ ව්‍යාපාරය සාර්ථක වීමට බලපෑ හේතු 02 ක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

(iv) යුරෝපයේ පුනරුදය ලංකාව කෙරෙහි ඇතිකළ සමාජ සංස්කෘතික බලපෑම් කරුණු 03 ක් යටතේ විස්තර කරන්න.

(ලකුණු 06 යි)

09

(i) ඇමරිකන් විප්ලවයේ දී ජනතාව පීඩනයට පත් කරමින් පැන වූ නව පනත් තුන නම් කරන්න.

(ලකුණු 03 යි)

(ii) ඇමරිකන් , ප්‍රංශ හා රුසියන් විප්ලව ඇසුරෙන් පහත ඒවාට පිළිතුරු සපයන්න.

a. ඇමරිකන් ජනපදවලින් බදු අයකිරීම ක්‍රමවත් කළ බ්‍රිතාන්‍ය අගමැතිවරයා

b. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා

c. "සමාජ සම්මුතිය" නම් කෘතිය රචනා කළ කතුවරයා

d. සෝවියට් රුසියාවේ ප්‍රථම සමාජවාදී නායකයා

(ජෝර්ජ් වොෂින්ටන් / රූසෝ / ජෝර්ජ් ග්‍රැන්විල් / ලියෝන් ට්‍රොට්ස්කි / වී. අයි. ලෙනින්)

(ලකුණු 04 යි)

(iii) ඇමරිකන් නිදහස් සටනට බලපෑ ආර්ථික ප්‍රතිපත්ති 02 ක් විස්තර කරන්න.

(ලකුණු 05 යි)

(iv) ප්‍රංශ විප්ලවයට තුඩුදුන් දේශපාලන හේතු 03 ක් නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 06 යි)


ශ්‍රී ලංකාව

